# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2021/2022

### ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයන (සිංහල/ඉංග්‍රීසි) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරාගැනීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණයට අයදුම්පත් කැඳවීම

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා ප්‍රවේශයට අදාළ ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇති අත්පොතෙහි අංක 2.2.8.27 දරන වගන්ති යටතේ සඳහන් කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන ඉහත උපාධි පාඨමාලාවට සිසුන් තෝරාගැනීම සඳහා පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් මෙම අභියෝග්‍යතා පරීක්ෂණයට ද අයදුම් කර එයට පෙනී සිට එයින් සමත් විය යුතු ය.

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යා හා භාෂා පීඨයේ භාෂා අධ්‍යයනාංශය පවත්වන සිව් අවුරුදු වෘත්තීය උපාධි පාඨමාලාවක් වන මෙය ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාමාර්ගයෙහි කොටසක් ද වේ.** මෙම උපාධි පාඨමාලාවේ මූලික අරමුණ වන්නේ භාෂා පරිවර්තනය පිළිබඳ සෛද්ධාන්තික දැනුමෙන් සහ ප්‍රායෝගික කුසලතාවන්ගෙන් යුතු විද්‍යාර්ථීන් නිර්මාණය කිරීම යි. ත්‍රිභාෂා ප්‍රතිපත්තිය මෙහි ලා ක්‍රියාත්මක වන අතර උපාධි අපේක්ෂකයන්ගේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනයටත්, ඔවුන්ට දෙමළ භාෂා ප්‍රවීණතාව ලබාදීමටත් එයින් අපේක්ෂිත ය.

2021 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිට කවර හෝ විෂය ධාරාවකින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබා තිබෙන අපේක්ෂකයෝ අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබති. යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වීමේ අරමුණ වන්නේ පාඨමාලාව හැදෑරීම සඳහා යෝග්‍ය සිංහල සහ ඉංග්‍රීසි භාෂා කුසලතාවෙන් යුතු ශිෂ්‍ය කණ්ඩායමක් තෝරාගැනීම යි.

මේ සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන් 2022 සැප්තැම්බර් 24 වැනි දින හෝ ඊට පෙර *www.sab.ac.lk* යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙහි සපයා ඇති මාර්ගගත අයදුම්පත් ද්වාරය (Online Application Portal) https://sab.ac.lk/trl-aptitude-test හරහා යෝග්‍යතා පරීක්ෂණය සඳහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. පහත සඳහන් ලේඛනවල පැහැදිලිව පරිලෝකනය කරන ලද පිටපත් (scanned copies) මෙහි දී උඩුගත (upload) කළ යුතු ය.

- ලංකා බැංකුවේ 0002246976 අංක දරන, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ගිණුම් අංකයට බැර වන සේ ගෙවන ලද රු 1200/-ක ලදුපත (විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ලබාගත්) - (චෙක්පත් සහ තැපැල්/මුදල් ඇණවුම් භාරගනු නොලැබේ).

- ඔබ විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් කරනු ලබන තොරතුරු සහ අනෙකුත් සහතිකවල යම් නොගැළපීමක් වේ නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අන්තර්ගත දිවුරුම් ප්‍රකාශයක්

**තැපෑලෙන් එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

අදාළ අභියෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ විභාග ශාලාව විශ්වවිද්‍යාල වෙබ් අඩවිය හරහා ඉදිරියේ දී දැනුම් දෙනු ඇති අතර විභාග ප්‍රවේශ පත්‍රය මාර්ගගත අයදුම්පත් ද්වාරය (Online Application Portal) හරහා බාගත කර ගැනීමේ පහසුකම් සපයනු ඇත.

**ලේඛකාධිකාරී**

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**බෙලිහුල්ඔය**

2022.09.04